CENTRE FOR THE STUDY OF HUMAN RIGHTS
UNIVERSITY OF PERADENIYA
PERADENIYA, SRI LANKA

2022. 03. 31

**දැන්වීමයි**

**උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණුවන්නන් බඳවා ගැනීමේ වැඩසටහන සඳහා අයදුම්පත් භාරගැනීමේ දිනය දීර්ඝ කිරීම**

මානව අයිතිවාසිකම් අධ්‍යයන කේන්ද්‍රයේ උපාධිධාරී පුහුණුවන්නන්/පුහුණුවන්නියන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ සිංහල මාධ්‍ය පාඨමාලා සඳහා පේරාදෙණි විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගෙන් පමණක් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. තෝරාගනු ලබන අය සඳහා සියලු දීමනා ඇතුළත්ව රු. 38,525.00 ක මාසික දීමනාවක් ලැබෙනු ඇත.

මේ සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයට ඉල්ලුම් කළ හැකිය.

- මෑත වර්ෂවල දී උපාධිය ලබා ගත් අය වීම.
- පරිගණක භාවිතය සහ ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය සම්බන්ධයෙන් දැනුමක් තිබීම.
- ඉංග්‍රිසි භාෂාව පිළිබඳ විශේෂ හැකියාවක් තිබීම.
- පේරාදෙණි විශ්වවිද්‍යාලයේ මානව අයිතිවාසිකම් කේන්ද්‍රය මගින් පවත්වනු ලබන සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලා දෙකෙන් එකක් සමත් වී තිබීම.

පුරප්පාඩු සංඛ්‍යාව - 2 (සිංහල මාධ්‍ය)

- ඔබගේ සියලු අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද සම්බන්ධ විස්තර ඇතුළත් ජීව දත්ත තොරතුරු සහිත ඉල්ලුම්පත පහත සඳහන් ලිපිනයට **2022. 04. 20** වන දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
- ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස "උපාධිධාරී පුහුණුවන්නන් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ
මානව අයිතිවාසිකම් අධ්‍යයන කේන්ද්‍රය,
SPB 2,
ශාස්ත්‍ර පීඨය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.